## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය - 2015

------------------------------------------------

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

-----------------------------------

සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂයේදී ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රදාන පිළිවෙලින් රු.3,492,459 ක් හා රු.8,779,054 ක් ලැබී තිබුණ අතර එය ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් ගිණුම්ගත කිරීම වෙනුවට ආදායමට ගලපා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

-----------------------------------

(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලාදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.467,705 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) අනෙකුත් උපකරණ සඳහා ක්ෂය අනුපාතය ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

-----------------------------------

සේවක ප්‍රතිලාභ බැදීම් ගණනයේදී ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24
----------------------------------

මණ්ඩලයේ සභාපති මණ්ඩලයේ ආශ්‍රිත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වන අතර මණ්ඩලය විසින් සමාගමේ මෙහෙයුම් හා මූල්‍ය කටයුතු සම්බන්ධ තීරණ සඳහා දායක වන ප්‍රමාණය හා මණ්ඩලය එම සමාගමට ගෙවනු ලබන ගොඩනැගිලි කුළිය, ශ්‍රවණාගාර ගාස්තු, ජලය, පවිත්‍රතා හා විදුලිය වියදම් පිළිබඳ තොරතුරු සටහනක් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38
----------------------------------------

මණ්ඩලයේ වෙබ් අඩවිය සංවර්ධන කිරීම සඳහා වැය කරන ලද රු.5,128,000 ක මුදල අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගෙන නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39
----------------------------------

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ හිටි අපනයන ණය ශේෂය රු.46,120,175 ක් වූ අතර ඉන් රු.45,477,591 ක් සඳහා හානිකරණ ප්‍රතිපාදන කර තිබුණි. අපනයන ණය අය කර ගැනීමේ ප්‍රගතිය සලකා බැලීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සමාන ප්‍රමාණයකින් හානිකරණය සඳහා ප්‍රතිපාදනය කර තිබුණ බැවින් හානිකරණය වූ සමාගම්වලින් අය වූ රු.379,868 ක් අදාළ ගිණුම්වල ගැලපීම සිදුකර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව රු.163,370,566 ක් වූ මූල්‍ය සාධන පත්‍ර, ජංගම නොවන මූල්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(iii) වටිනාකම රු.25,750,000 ක් වූ කොටස් ආයෝජනය කර තිබූ සමාගම් 04 කින් පසුගිය වසර 07 ක කාල පරිච්ඡේදය තුළ ලාභාංශ ලැබී නොතිබුණ අතර ඒ සඳහා හානිකරණ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ ණයගැති ගිණුමේ රු.387,000 ක් වූ අසාමාන්‍ය බැර ශේෂ හා ණයහිමි ගිණුමේ රු.10,528,683 ක් වූ අසාමාන්‍ය හර ශේෂ හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.1,920,799 ක් වූ පරිගණක මෘදුකාංග, රු.22,555 ක් වූ පරිගණක උපකරණ හා රු.8,750 ක් වූ දුරකථන සවිකිරීම්වලට අදාළ ක්ෂය ගලපා නොතිබුණි.

(ඇ) ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා ලැබුණු රජයේ ප්‍රදාන, වත්කමෙහි ප්‍රයෝජනවත් ජීවිත කාලය අනුව ක්‍රමවත් පදනමක් මත ලාභ අලාභ වශයෙන් හඳුනා ගත යුතු අතර ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ක්‍රමක්ෂය ලෙස රු.13,347,223 ක් ගිණුම්ගත කළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.3,323,500 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) අපනයනකරුවන් වෙත ආපසු ගෙවිය යුතු රු.3,181,941 ක් ආදායම් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් එකී ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම වගකීම් අඩුවෙන් හා ආදායම වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) අපනයන නිෂ්පාදන ගම්මාන ස්ථාපිත කිරීම සඳහා 2002 දෙසැම්බර් 24 දින වන විට අවස්ථා 06 කදී අපනයන නිෂ්පාදන ගම්මාන සමාගම සඳහා මණ්ඩලය ලබා දුන් ණය මුදලට අදාළ රු.2,997,619 ක් වූ පොලිය ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

2015 දෙසැම්බර් 31 දිනට ණය අරමුදලේ ශේෂය උපලේඛනය අනුව රු.7,716,549 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.7,888,533 ක් වූයෙන් රු.171,984 ක පැහැදිලි නොකළ වෙනසක් පැවතුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

| ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| (අ) උපචිත වියදම් | 12,821,283 | උපලේඛන හා කාල විශ්ලේෂණ |
| (ආ) ආපසු ගෙවිය යුතු තැන්පත් | 8,197,360 | |
| (ඇ) කුසලතා සංවර්ධන වැඩසටහන් වියදම් | 4,728,200 | ගෙවීම් වවුචර් හා වැය කළ ව්‍යාපෘතිය පිළිබඳ විස්තර |

**2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අපනයන තත්ත්වයේ එළවළු අඛණ්ඩව නිෂ්පාදනය කිරීමේ අරමුණින් ඌව පරණගම ගම්මානය පදනම් කරගෙන ආරම්භ කළ ව්‍යාපෘතිය වෙනුවෙන් ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන අරමුදලින් ලබා දුන් ණය මුදල සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල රු.5,000,000 ක් විය.

(ආ) සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.71,254 ක් හා ණයගැතියකුගෙන් අයවිය යුතු රු.51,235 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 මාර්තු 27 දින පෝලන්තයේ පැවැත් වූ ව්‍යාපාරික රැස්වීමක් සඳහා මණ්ඩලය වෙනුවෙන් සහභාගී වූ නිලධාරීන්ගේ වියදම් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයට ගෙවන ලද මුදලින් රු.127,465 ක් 2015 දෙසැම්බර් 31 දින දක්වාම පියවා නොතිබුණි.

## 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ ධුරය, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 23(I) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ කටයුතු පහසු කිරීම සඳහා කළ පත් කිරීමක් බව පත්වීම් ලිපියේ සඳහන් කර තිබුණද පනතේ එම වගන්තිය යටතේ නිලධාරීන් පත්කිරීම සම්බන්ධව ප්‍රතිපාදන සලසා නොතිබුණි. අදාළ නිලධාරියාට පත්වීම ලබා දුන් 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වැටුප් හා දීමනා ලෙස රු.4,076,773 ක් ද රාජකාරි හා පෞද්ගලික ගමන් සඳහා ලබාදී තිබූ වාහනයේ කුළී ලෙස රු.6,270,670 ක් ද විදේශ ගමන් සඳහා දීමනා හා ගමන් ගාස්තු ලෙස රු.2,122,770 ක් ද වශයෙන් එකතුව රු.12,470,213 ක් විධිමත් අධිකාරියකින් තොරව ගෙවා තිබුණි. තවද මුදල් රෙගුලාසි 135 පරිදි මණ්ඩලයේ මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පැවරීමක් කර නොතිබුණද චෙක්පත් අත්සන් කිරීම සිදුකර තිබුණි.

(ආ) 2012 ජුනි 08 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝගය මත භාණ්ඩාගාර උපදෙස් අනුව 2011 ජුනි 03 සිට බලපැවැත්වෙන පරිදි මාසිකව රු.60,000 ක කුළී පදනම මත වාහන ලබා ගත යුතු වුවත් ඊට පටහැනිව මණ්ඩලය විසින් එදින සිට 2015 දෙසැම්බර් 31 දක්වා වාහන කුලියට ගෙන රු.11,703,560 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඇ) සමර් ෆැන්සි ෆුඩ් වෙළඳ ප්‍රදර්ශනය පැවැත් වූ කාලසීමාව තුළ අනුමත වැය ඇස්තමේන්තුවේ ඇතුළත් නොවූ ප්‍රදර්ශනයේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් රු.76,999 ක් මණ්ඩලය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයට ගෙවා තිබුණද ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත | |
| (i) 2(1) වගන්තිය | 1992 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ වර්ෂ 23 ක කාලපරිච්ඡේදය තුළදී අපනයන සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික සංවර්ධන සභාව රැස්වී නොතිබුණි. |
| (ii) 13(1), (2) වගන්ති | අපනයන සංවර්ධන අරමුදල නමින් අරමුදලක් පිහිටවිය යුතු අතර මණ්ඩලයේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙහි හා ඉටු කිරීමෙහි ලා මණ්ඩලයට දරන්නට වන වියදම් පියවීමට අවශ්‍ය සියළු මුදල් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු වුවත් මණ්ඩලය එම වගන්ති අනුව අපනයන සංවර්ධන අරමුදල පිහිටුවීමට 2016 දෙසැම්බර් 27 දින වන විටත් කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 හා 1980 අංක 16 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 44 වගන්ති | සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකත්වය ගණනය කිරීමේදී විශේෂ දීමනා, වෘත්තීය දීමනා, අන්තර් දීමනා හා අනුමත නොවූ විශේෂ ජීවන වියදම් දීමනා ඇතුළත් නොකල යුතු අතර ජීවන වියදම් දීමනාව ඇතුළත් කළ යුතුය. එහෙත් ඊට පටහැනිව ගණනය කිරීම හේතුවෙන් විගණනයට භාජනය වූ 2012 සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලට රු.5,508,199 ක් හා සේවක භාරකාර අරමුදලට රු.659,375 ක් වැඩියෙන් දායක වී තිබුණි. |
| (ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 6 (2)(අ) වගන්තිය | පාරිතෝෂික සඳහා වෙන්කිරීමේදී විශේෂ දීමනා, වෘත්තීය දීමනා, අන්තර් දීමනා හා අනුමත නොවූ විශේෂ ජීවන වියදම් දීමනා ඇතුළත් නොකල යුතු අතර ජීවන වියදම් දීමනාව ඇතුළත් කළ යුතුය. එහෙත් ඊට පටහැනිව ගණනය කිරීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික සඳහා රු.19,298,351 ක් වැඩියෙන් වෙන්කර තිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>--------------------------------- | |
| (i) VIII වැනි පරිච්ඡේදයේ 4.1 හා 10.1 වගන්ති හා 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වගන්තිය | • නිවාඩු දිනයක වැඩ කිරීමට නියම කරනු ලබන මාණ්ඩලික නිලධාරියකු දිනකට පැය 8 කට නොඅඩු කාලයක් සේවය කළ යුතු වුවද පැය 8 කට අඩු කාලයක් සේවය කර තිබූ අවස්ථාවන් හා සතියේ දිනයන්හි රාජකාරී වේලාවන්ට පසුව වැඩ කරනු ලැබූ කාලය එකතු කර දින ගණනට පරිවර්තනය කර නිවාඩු දින වැටුප් ලෙස රු.229,932 ක් ගෙවා තිබුණි.<br>• අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව මාසයකට නිවාඩු දින 02 කට වැඩියෙන් සේවයේ යෙදීම වෙනුවෙන් නිලධාරීන් 24 දෙනෙකු වෙත රු.119,463 ක් ගෙවා තිබුණි. |
| (ii) VIII වැනි පරිච්ඡේදයේ 7 වගන්තිය | මාසයකට පැය 20 ඉක්මවා අතිකාල දීමනා ගෙවීමට අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව නිලධාරීන් 48 දෙනෙකු වෙත රු.98,763 ක් අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| (iii) XIV වැනි පරිච්ඡේදයේ 04 වන වගන්තිය | නිලධරයෙකුට ස්වකීය කාර්ය ස්ථානයෙන් රාජකාරී සඳහා පිටවී සිටින කාලය වෙනුවෙන් නිලධාරියාගේ යැපීම් සහ නවාතැන් පිළිබඳ සංයුක්ත වියදම් දීමනාවක් ගෙවිය යුතු වුවද එසේ සිටි කාලය දින ගණනට පරිවර්තනය කර නිලධාරියාගේ මාසික වැටුපෙන් 1/20 ක් ලෙස ගණනය කර නිලධාරීන් 12 දෙනෙකු වෙත රු.36,979 ක් ගෙවා තිබුණි. |

(iv) XV වැනි පරිච්ඡේදයේ 11.1 වගන්තිය

ගුවන් මගින් කරනු ලබන සියලුම ගමන්, පිරිමැසුම් පන්තිය උපයෝගී කරගෙන යායුතු වුවත් ඊට පටහැනිව මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකුට ව්‍යාපාරික පන්තියේ ගුවන් යානා පත්‍ර මිලදී ගැනීමට 2014 සහ 2015 වර්ෂ වෙනුවෙන් රු.2,105,300 ක් වැය කර තිබුණි.

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
-----------------------------

(i) 2007 සැප්තැම්බර් 11 දිනැති අංක 21/2007 දරන චක්‍රලේඛය සහ ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 10.1 හා 10.1.1 වගන්ති

එක්ස්පෝ මිලානෝ වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වූ නිලධාරීන් දෙදෙනෙකු වෙත ශ්‍රී ලංකාවෙන් පිටත්වීමට පෙර ලබා ගත් අග්‍රාමාත්‍ය අනුමැතිය ඉක්මවා රටෙන් බැහැරව සිටි කාලය සඳහා රු.605,803 ක් ගෙවා තිබුණි.

(ii) 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (IV) චක්‍රලේඛය

අනුයුක්ත කළ නිල වාහන හිමිකම් ඇති නිලධාරීන්ට මාසික ඉන්ධන දීමනාව ගෙවීමේදී තනතුර අනුව අනුමත උපරිම සීමාව ඉක්මවා ඉන්ධන දීමනා ගෙවා තිබුණි. 2014 ජනවාරි 01 දින සිට 2015 ජුනි 01 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළව කළ නියැදි පරීක්ෂාවේදී නියමිත සීමාව ඉක්මවා ගෙවූ ඉන්ධන දීමනාව රු.213,302 ක් විය.

(ඊ) භාණ්ඩාගාර චක්‍රලේඛ
-------------------------

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය

ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(උ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ
------------------------

(i) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය

පරිගණක හා පරිගණක උපාංග වෙනුවෙන් වෙනම වත්කම් ලේඛනයක් පැවැත්විය යුතු වුවද, වටිනාකම රු.33,066,961 ක් වූ පරිගණක හා උපාංග වෙනුවෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ii) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන චක්‍රලේඛය

සෑම මුදල් වර්ෂයකම දෙසැම්බර් 15 දිනට පෙර එම වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල පත්කර අවසන් කළ යුතු අතර ඊළඟ වර්ෂයේ පෙබරවාරි 26 දින වන විට භාණ්ඩ සමීක්ෂණයේ කටයුතු අවසන් කර එම වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු වුවත් 2016 අගෝස්තු 04 වන විටත් 2015 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි.

(ඌ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ
---------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 5.2.5 ඡේදය

එළඹෙන වර්ෂයේ අයවැය ලේඛනය සඳහා යථෝක්ත වර්ෂය එළඹීමට දින 15 කට පෙර භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවත් 2015 වර්ෂයේ අයවැය ලේඛනය 2015 මාර්තු 12 වන විටත් භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා යොමු කර නොතිබුණි.

(එ) 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතවම අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක්, තම පාලක මණ්ඩලවල අනුමැතිය ඇතිව සිය සේවකයින්ට ගෙවිය යුතු වුවත් 1992 වර්ෂයේ සිට වැටුප සමඟ ගෙවූ වෘත්තීය දීමනා හා විශේෂ ජීවන වියදම් දීමනා සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. පසුගිය වසර 3 ක හා සමාලෝචිත වර්ෂය සඳහා එසේ ගෙවන ලද වෘත්තීය දීමනාව රු.2,182,894 ක් වූ අතර විශේෂ ජීවන වියදම් දීමනාව රු.18,284,887 ක් විය.

(ii) මණ්ඩලය කාර්යාලීය සේවකයින් සඳහා ප්‍රවාහන සේවා පහසුකම් සැපයීම හා ප්‍රවාහන දීමනාව ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. මණ්ඩලය මගින් සපයන ප්‍රවාහන සේවාව භාවිතා නොකරන නියෝජ්‍ය අධ්‍යක්ෂවරු සඳහා මාසිකව රු.5,500 ක ප්‍රවාහන දීමනාවක් හා අනෙකුත් නිලධාරීන් සඳහා දෛනිකව රු.172 ක් ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී සේවකයින්ට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා වැය කළ මුදල රු.12,458,798 ක් විය.

## 3. මූල්‍ය සමාලෝචනය

-------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.70,144,039 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.105,751,865 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.35,607,826 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රජයේ ප්‍රදාන අඩුවීම හා අනෙකුත් ආදායම් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලය පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වසර 04 ක දායකත්වය ඇගයීමේදී 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දායකත්වය සියයට 2.6 සිට සියයට 85 දක්වා වර්ධනයක් පැවතියද සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී එම දායකත්වය පිළිවෙලින් සියයට 0.93 කින් හා සියයට 0.29 කින් අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 4.1 කාර්යසාධනය

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුව අරමුණු පහත දැක්වේ.

(i) මහින්ද චින්තන - ඉදිරි දැක්ම අපේක්ෂිත ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ශ්‍රී ලංකාවේ අපනයන ආදායම වර්ෂ 2020 දී ඇ.ඩොලර් බිලියන 20 දක්වා ඉහළ නැංවීම.

(ii) යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපද වෙළඳපලවලට කරනු ලබන ශ්‍රී ලංකාවේ අපනයන ස්ථාවරව පවත්වා ගන්නා අතරතුර, අනෙකුත් විදේශ වෙළඳපලවලට කරනු ලබන අපනයන, සමස්ත අපනයන ඉපැයුමෙන් සියයට 50 කට වඩා වැඩි මට්ටමකට ඉහළ නැංවීම.

(iii) ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායමට සියයට 80 ක් පමණ දායක කරනු ලබන හඳුනාගත් ප්‍රමුඛ භාණ්ඩ හත (07) පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින්, ඒවායේ අපනයන ආදායම සැලකිය යුතු ලෙස වැඩිකිරීම.

(iv) ඒකාබද්ධ අලෙවි සන්නිවේදන වැඩසටහන් තුළින්, ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ හා සේවා පිළිබඳව ධනාත්මක ප්‍රතිරූපයක් අන්තර්ජාතිකව ඇති කිරීම.

(v) අපනයන වෙළඳාමේ ප්‍රතිලාභ, එම ක්ෂේත්‍රයේ නියැලෙන සියලු පාර්ශවයන්ටම සහ දිවයිනේ සෑම පළාතකටම ගලා යාමට සැලැස්වීම.

(vi) සේවක ඵලදායීතාව සහ කැපවීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, ආයතනයේ මූලික වටිනාකම් මත ගොනු වූ විශිෂ්ඨ කණ්ඩායමක් මණ්ඩලය තුළ බිහි කිරීම.

(ආ) අපනයන ඉපැයීම් උපරිම කිරීම හා ජාතික ආර්ථිකයට දායකත්වයක් සැපයීම සඳහා මණ්ඩලය විසින් කෘෂිකර්ම, ධීවර හා කර්මාන්ත ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන දේශීය හා විදේශීය වෙළඳ ප්‍රදර්ශන හා ප්‍රවර්ධන වැඩසටහන් වෙනුවෙන් පසුගිය වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී වැය කළ මුදල පිළිවෙලින් රු.245,617,331 ක් හා රු.300,282,287 ක් වුවද එම ක්ෂේත්‍රවල සමස්ත අපනයන ආදායමේ වර්ධනය පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 5.75 කින් අඩු වී තිබුණි.

(ඇ) 2015 වර්ෂය සඳහා ඒකාබද්ධ කෘෂි ආදර්ශ, කෘෂි කලාප හා කෘෂිකර්මය සම්බන්ධ වැඩසටහන්, අපනයන ප්‍රවර්ධන වැඩසටහන් ලෙස හඳුනා ගෙන ඒ සඳහා රු.60,860,000 ක වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන් කර තිබුණද එයින් රු.13,280,000 ක් එනම් සියයට 40 ක් පමණක් අපනයන සංවර්ධන වියදම් ලෙස වැය කර තිබුණි. එවැනි වැඩසටහන්වල ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ ඇගයීම් හා සමාලෝචනය සඳහා වූ පසුවිපරම් කටයුතු කිරීම වෙනුවෙන් නිර්ණායක හා පිළිවෙත් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණ හෙයින් එවැනි වැඩසටහන් අසාර්ථක වී තිබුණි.

(ඈ) 2014 හා 2015 වර්ෂවල පිළිවෙලින් රු.35,220,000 ක් වූ ක්‍රියාකාරකම් 24 ක් ද රු.67,220,000 ක් වූ ක්‍රියාකාරකම් 52 ක් ද ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටුකර නොතිබුණි. වැඩසටහන් හා සම්බන්ධවන ආයතන, පුද්ගලයන්, සංවිධාන සමඟ මූලික සාකච්ඡා කිරීමකින් තොරව හා විවිධ රටවල සාමාජීය, ආර්ථීක, දේශපාලනික වටපිටාව පිළිබඳ පූර්ව සමාලෝචනයකින් තොරව 2014 වර්ෂයේදී රු.850,000 ක වැඩසටහන් 05 ක් හා 2015 වර්ෂයේදී රු.16,350,000 ක වැඩසටහන් 09 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීම නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. ඉතිරි වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමට හේතු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ප්‍රාදේශීය සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වූ හා ඉදිරි වර්ෂ සඳහා ද ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා 2016 වර්ෂයේදී අරමුදල් ප්‍රතිපාදන නොකිරීමට හා ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොකිරීමට හේතු අනාවරණය නොවිණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති යෝජනාවක් නොමැතිව මණ්ඩලය අනුමත කර තිබූ උතුරු හා නැගෙනහිර පළාත්වල සංවර්ධන තොරතුරු රැස් කිරීමේ ව්‍යාපෘතිය 2014 ක්‍රියාකාරී සැලැස්මට හෝ අයවැයට ඇතුළත් කර නොතිබුණ අතර 2014 මාර්තු සිට මාස 9 ක් ඇතුළත ක්‍රියාත්මක කළ යුතු මෙම ව්‍යාපෘතිය 2016 ජූලි 25 දින වන විටත් ක්‍රියාත්මක වී නොතිබුණි. එසේම මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ ආයතනයන්හි සේවයේ නියුක්ත ක්ෂේත්‍ර නිලධාරීන් තෝරාගෙන තිබුණද එම නිලධාරීන් බඳවා ගැනීම හා දීමනා ගෙවීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) එක්ස්පෝ මිලානෝ ප්‍රදර්ශනය

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකාවේ වෙළඳ හා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2015 මැයි 01 සිට ඔක්තෝබර් 31 දක්වා ඉතාලියේ මිලානෝහි පැවැත්වූ එක්ස්පෝ මිලානෝ 2015 ප්‍රදර්ශනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව රු.4,440,336 ක් වැඩිපුර වැය කර තිබුණි.

(ii) අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොමැතිව මෙම ප්‍රදර්ශනය සඳහා පත් කර තිබූ එක්ස්පෝ කොමසාරිස් ජනරාල්වරයා එක්ස්පෝ අධිකාරිය සමඟ ඇතිවූ නොඑකඟතාවය නිසා ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය නිර්මාණ කටයුතු සඳහා රු.12,960,000 ක් වූ ඉතාලි රජයේ දායකත්වය ශ්‍රී ලංකාවට අහිමි වී තිබූ අතර ප්‍රදර්ශන කුටිය නිර්මාණය සඳහා රු.27,944,464 ක වියදමක් දැරීමට සිදුවී තිබුණි. මෙම හේතුව නිසා එම නිලධාරියා තනතුරෙන් ඉවත් කර තිබුණද රජයට අහිමි වූ රු. 12,960,000 මුදල නිලධාරියාගෙන් අය කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iii) 2015 අගෝස්තු 06 වන දින වන විට මෙම ප්‍රදර්ශනයට රු.16,670,000 ක් වූ මණ්ඩලයේ දායකත්වයෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට රු.10,000,000 ක් ගෙවා තිබුණ අතර ප්‍රදර්ශනය 2015 ඔක්තෝබර් 31 දින අවසන් වී තිබියදීත් ඒ සඳහා වැය වූ සත්‍ය වියදමට දායක විය යුතු මුදල පිළිබඳව එකඟතාවය ඇති කර ගෙන නොතිබුණි. එසේම මණ්ඩලය විසින් තවදුරටත් ගෙවිය යුතු රු.6,670,000 සඳහා 2015 මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීමක් කර නොතිබුණු අතර ශේෂ තහවුරු කිරීමේ ලිපි විගණනයට යොමු කර නොතිබුණි.

(iv) අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව රු.5,040,000 ක මුදලක් එක්ස්පෝ ශ්‍රී ලංකා දිනය වෙනුවෙන් වෙන්කර තිබියදීත් මණ්ඩලයේ සභාපති සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් එම දිනය වෙනුවෙන් සහභාගී වීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ප්‍රතිපාදිත මුදලට අමතරව රු.1,079,688 ක් වැය කර තිබුණි.

(v) ප්‍රදර්ශනයට සහභාගී වූ අධ්‍යක්ෂවරුන්ට මාධ්‍ය සාකච්ඡා සඳහා සහභාගීවීමේ වගකීම භාර ගත හැකිව තිබියදී, රටින් බැහැරවීම වෙනුවෙන් ජනාධිපතිවරයාගෙන් අවසරය ලබා නොගෙන ස්විස්ටර්ලන්තයේ පෞද්ගලික සංචාරයක යෙදී සිටි අතරතුර මෙම ප්‍රදර්ශනයේ මාධ්‍ය සාකච්ඡාවකට සහභාගී වූ මණ්ඩලයේ සභාපති වෙනුවෙන් රු.163,194 ක වියදමක්ද දරා තිබුණි.

(vi) කිසිදු සැලසුමකින් හා නිශ්චිත පදනමකින් තොරව ප්‍රදර්ශන අධ්‍යක්ෂවරුන් ලෙස මණ්ඩලයේ නිලධාරීන් තෝරා ගෙන තිබූ අතර මෙම නිලධාරීන්ට 2015 මැයි 15 දිනැති අංක MF01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 04(ඩී) වගන්තිය අනුව භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව විදේශ ගමන් දීමනා සඳහා රු.3,770,640 ක් ගෙවා තිබුණි.

(vii) ප්‍රදර්ශන අධ්‍යක්ෂ ලෙස තෝරා ගනු ලැබූ නිලධාරීන් නියමිත කාලයට වඩා වැඩි කාලයක් සේවයේ යෙදීම වෙනුවෙන් අනුමැතියකින් තොරව රු.120,459 ක් ගෙවා තිබුණි.

(ඇ) ආයෝජන

------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මණ්ඩලය විසින් රු.17,315,000 ක් සාමාන්‍ය කොටස්වල ආයෝජන කර තිබුණු සමාගම් 3 ක් සමාලෝචිත වර්ෂයේ විසුරුවා හැර තිබුණද එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි නොකිරීම මත සමාගම් ලේඛනයෙන් නම ඉවත් කර තිබූ සමාගම් 18 ක වරණීය කොටස් වටිනාකම රු.93,841,428 ක් සහ සමාගම් 17 ක සාමාන්‍ය කොටස් වටිනාකම රු.5,132,890 ක් වූ ආයෝජන උපලබ්ධි කර ගැනීම සඳහා මණ්ඩලය විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) 1971 අංක 38 දරන මුදල් පනතේ 25 වගන්තිය, 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව විශේෂ අරමුදල් පිහිටුවීම සඳහා ඇති ප්‍රතිපාදනවලට යටත්ව අරමුදල් පිහිටුවිය යුතු අතර එය මුදල් අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානයන්ට හා පාලනයන්ට යටත්ව ක්‍රියාත්මක විය යුතු වුවත් ඊට පටහැනිව මණ්ඩලය විසින් අනුමැතියකින් තොරව ණය අරමුදලක් පිහිටුවා තිබුණි. තවද මණ්ඩලය විසින් අනුමත නොවූ ඉහත ණය අරමුදලට සේවකයින්ගේ ඒකාබද්ධ වැටුපෙන් මාසිකව සියයට එකක් හා රජයේ ප්‍රදාන භාවිතා කර මාසිකව සියයට 7.2 ක පොලියක් බැර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට මෙම ණය යෝජනා ක්‍රමයට සේවක දායකත්වය රු.5,149,018 ක් හා එම දායක මුදලට පොලිය රු.2,567,531 ක් වී තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

සමාලෝචිත වර්ෂයේදී රු.22,340,000 ක ප්‍රතිපාදන යටතේ ප්‍රතිලාභීන් 500 දෙනෙකු සඳහා කෘෂි උපකරණ හා කෘෂි ළිං ලබාදීම මගින් මන්නාරම දිස්ත්‍රික්කයේ අක්කර 250 ක භූමියක මිරිස්, ෆැෂන් හා අන්නාසි වගා කිරීම සඳහා ආරම්භ කළ අපනයන නිෂ්පාදන ගම්මානයේ අපේක්ෂිත කාර්යයන් 2015 මාර්තු 31 වන විට අවසන් කළ යුතු විය. එහෙත් ප්‍රතිලාභීන්ට උපකරණ ලබාදීම, අස්වනු එකතු කිරීමේ මධ්‍යස්ථාන ඇති කිරීම හා අපනයනකරුවන් සමඟ වෙළඳපොළ ඒකාබද්ධ කිරීම ආදී කාර්යයන් කිසිවක් සිදු නොකර ප්‍රතිලාභීන් 15 දෙනෙකු සඳහා නළ ළිං තනා දීමට 2015 මැයි 26 දින රු.1,050,000 ක අත්තිකාරම් මුදලක් නිදහස් කර තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මන්නාරම, මුලතිව් හා වව්නියාව දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කළ කුසලතා සංවර්ධන වැඩසටහන යටතේ රියදුරු පුහුණුව වෙනුවෙන් රු.4,728,200 ක් පුද්ගලික රියැදුරු පුහුණු

ආයතනයකට ගෙවා තිබුණි. පුද්ගලික රියැදුරු පුහුණු ආයතනයන් හරහා ලබා දෙන අපනයන ක්ෂේත්‍රය සම්බන්ධිත වූ පුහුණුව කවරක්ද යන්න පැහැදිලි කර ගැනීමටද මණ්ඩලය කටයුතු කර නොතිබුණ අතර පුහුණුව අවසන් කළ පුහුණුලාභීන් සේවා සැපයීම යටතේ අපනයනය සම්බන්ධයෙන් කටයුතු කර ඇත්ද යන්න පිළිබඳ පසු විපරමක් කර හෝ ඒ සඳහා අවශ්‍ය කටයුතු සැලසීමට හෝ මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි. 2016 ක්‍රියාකාරී සැලැස්මෙහි කුසලතා සංවර්ධන ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරකම් ඇතුළත් කර නොතිබූ හෙයින් මෙම ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා පිඟන් සහ වීදුරු කර්මාන්ත සංගමය විසින් 2002, 2004, 2006, 2011 සහ 2013 යන වර්ෂවල ස්වාධීනව පැවැත් වූ සම්මන්ත්‍රණයක් වෙනුවෙන් 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 12(1) වගන්තියට පටහැනිව, 2015 වර්ෂයේ දී සම්මන්ත්‍රණ හවුල්කරුවකු වශයෙන් මණ්ඩලය සම්බන්ධ වී ඒ වෙනුවෙන් රු.455,000 ක් වැය කර තිබුණි. උළු නිෂ්පාදන කර්මාන්තය සංවර්ධන වැඩසටහනට වෙන්කර තිබූ රු.500,000 ක මුදල මෙම සම්මන්ත්‍රණයට භාවිතා කර තිබුණි.

## 4.5 ආර්ථික නොවූ ගනුදෙනු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිවිසුමකින් හා තක්සේරු වාර්තාවකින් තොරව වාහන නැවතීමට භාවිතා කරන ලද භූමිය සඳහා මණ්ඩලයේ ආශ්‍රිත සමාගමට මාසිකව රු.4,000 බැගින් 2014 මැයි 07 දින සිට 2016 පෙබරවාරි 29 දක්වා එකතුව රු.296,809 ක් වූ බදු කුළී ගෙවා තිබුණද එම පරිශ්‍රය වාහන නැවතීම සඳහා භාවිතා කර නොතිබුණි.

(ආ) නිසි කළමනාකරණයක් හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සැලසුම් කිරීම හේතුවෙන් රු.7,280,000 ක් වෙන්කර ආරම්භ කර තිබූ අක්කර 50 ක භූමි ප්‍රමාණයක අන්නාසි වගා ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. තවද වවුනියාව හා මන්නාරම දිස්ත්‍රික්කයන්හි 2010 වර්ෂයේදී රු.22,720,000 ක් වියදම් කරමින් ආරම්භ කළ මිරිස් වගා ව්‍යාපෘතියේ සාර්ථකත්වය පිළිබඳ පසු විපරමකින් තොරව මන්නාරම දිස්ත්‍රික්කයේ නැවත මිරිස් වගාව සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කිරීම ඵලදායී නොවන කාර්යයක් වී තිබුණි.

(ඇ) සමාගම් 30 ක වරණීය කොටස්හි කළ රු.105,058,084 ක් වූ ආයෝජන සඳහා 1997 සිට 2014 කාලපරිච්ඡේදයට සහ සමාගම් 35 ක සාමාන්‍ය කොටස්වල කළ රු.58,312,484 ක් වූ ආයෝජන සඳහා 2001 සිට 2015 කාලපරිච්ඡේදයට අදාළව ලාභාංශ ලැබී නොතිබුණි.

(ඈ) වෙබ් පිටු නිර්මාණය කිරීමේ පළපුරුද්ද ඇති නිලධාරීන් 8 දෙනෙක් සහ පරිගණක වැඩසටහන් සම්පාදකවරුන් දෙදෙනෙකු සේවයේ නියුතුව සිටියදී 2014 ජුනි 30 දින සිට 2015 ජුනි 29 දක්වා කාලය තුළ මණ්ඩලයේ වෙබ් අඩවියක් සංවර්ධනය කිරීම සඳහා රු.5,128,200 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය සහ කාර්යාල ප්‍රවාහන සේවාව සපයන ආයතන අතර පැවති ගිවිසුම්වල වාහන සඳහා නවතා තැබීමේ පහසුකම් සපයන බවට මණ්ඩලය එකඟ වී නොතිබුණ බැවින් එම වාහන වෙනුවෙන් ගෙවූ රු.835,009 ක් වූ වාහන නැවතීමේ කුළී ගාස්තුව අදාළ බස් හිමියන්ගෙන් අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) මණ්ඩලයේ නිලධාරීන්ගේ ගුවන් ගමන් යානා පත්‍ර මිළදී ගැනීමේදී ප්‍රමාද ගාස්තු හා අවලංගු කිරීමේ ගාස්තු ලෙස 2014 වර්ෂයේදී රු.51,000 ක්ද 2015 ජුනි 30 දක්වා රු.7,000 ක්ද මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

(ඇ) ආරක්ෂක සේවා සපයන ආයතනයක් සමඟ මණ්ඩලය ඇති කර ගත් ගිවිසුමට අනුව දිනක ගාස්තුව බදු සහිතව රු.16,780 ක් වුවද ගෙවීම් කිරීමේදී එම බදු සහිත වටිනාකමට නැවත බදු ගණනය කර ගෙවීම නිසා 2015 ජනවාරි සිට ජූලි දක්වා රු.325,686 ක්ද අනුමත කාර්ය මණ්ඩලයේ අනුමත සේවා මුර අනුව ගෙවීම් නොකිරීමෙන් රු.157,900 ක්ද වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) කාර්යාල අභ්‍යන්තර වෙන්කිරීම සඳහා අවම මිල ඉදිරිපත් කළ ආයතනයට කොන්ත්‍රාත්තුව පිරිනමා නොතිබීම නිසා රු.49,467 ක් ද ඉවත් කළ ද්‍රව්‍ය වෙනුවෙන් ලැබිය යුතු මුදල රු.75,000 ක්ද මුල් සැලැස්ම වෙනස් කිරීම නිසා රු.282,233 ක් ද ගිවිසුම්ගත මුදලට වැඩියෙන් ගෙවූ මුදල රු.7,286 ක් ද ප්‍රමාද ගාස්තු රු.90,149 ක් ද වශයෙන් එකතුව රු.504,135 කින් මණ්ඩලයට පාඩු සිදුවී තිබුණි.

(ඉ) ආහාරපාන සැකසුම්කරණයේ සහ අපනයන ක්ෂේත්‍රයේ නියැලෙන අපනයනකරුවන් 25 දෙනෙකු සහභාගී කරවමින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ 2015 පෙබරවාරි 08 දින සිට 12 වන දින දක්වා පැවත්වූ වෙළඳ ප්‍රදර්ශනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට පටහැනිව කටයුතු කිරීම නිසා මණ්ඩලය රු.225,370 ක් වැඩියෙන් වැය කර තිබුණි.

(ඊ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් 2013 නොවැම්බර් 13 සිට 17 දක්වා පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට සමගාමීව පවත්වන ලද වෙළඳ ප්‍රදර්ශනයේ සංවිධාන හා කළමනාකරණ කටයුතු මණ්ඩලයට පවරා නොතිබුණද ඒ සඳහා මණ්ඩලය රු.10,934,625 ක් වැය කර තිබුණි. ප්‍රදර්ශනයේ සංවිධාන හා කළමනාකරණ කටයුතු සඳහා සමාගමක් තෝරා ගැනීමේදී ඉදිරිපත් කළ ලංසු අතරින් අඩුම මිල ගණන් සැලකිල්ලට නොගැනීම හේතුවෙන් මණ්ඩලයට සිදු වූ පාඩුව රු.8,184,555 ක් විය.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව අදාළ සුදුසුකම් සපුරා නොතිබුණ අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රචාරක නිලධාරි තනතුරු සඳහා නිලධාරීන් දෙදෙනෙකුද කළමනාකරණ සහකාර තනතුරට නිලධාරීන් තුන් දෙනෙකුද බඳවා ගෙන තිබුණි.

(ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව අඛණ්ඩ දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොතිබුණු සේවකයින් 8 දෙනෙක්ද පුහුණුව සඳහා බඳවා ගෙන තිබුණු සේවකයින් 6 දෙනෙක්ද ස්ථිර කර තිබුණි.

(ඇ) කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ සේවකයින් ස්ථිර කිරීමේදී අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව අධ්‍යාපන සුදුසුකම් සපුරා නොතිබුණු සේවකයින් 9 දෙනෙක් ස්ථිර කර තිබුණි.

**4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයට අයත් වාහන 5 ක් සහ නිලධාරීන් 4 දෙනෙකු ජනාධිපති කාර්යාලයට, විෂයභාර අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම්ට, අමාත්‍යවරයාගේ මාධ්‍ය අංශයට හා

රේඛීය අමාත්‍යාංශයේ සේවයට යොදවා සමාලෝචිත වර්ෂයේදී වාහන නඩත්තු වියදම් සහ කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ලෙස රු.1,311,777 ක් මණ්ඩලය විසින් දරා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**
**---------------------------------------**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**---------------------------------**

2003 ජුනි 03 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව අදාළ ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් 2015 මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිට ඉදිරිපත් කර තිබුණේ 2016 අප්‍රේල් 28 දිනය.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**
**---------------------**

සැලැස්මේ අඩංගු එක් එක් ක්‍රියාකාරකම් ආරම්භ කළ යුතු දිනය, අවසන් කළ යුතු ඉලක්කගත දිනයන් හා ඉලක්කගත භෞතික ප්‍රමාණය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**
**------------------------**

අභ්‍යන්තර විගණන ඒකකයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර වසර දෙකක් පුරප්පාඩුව පැවති අතර ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී විගණන විමසුම් දෙකක් පමණක් නිකුත් කර තිබුණි. අභ්‍යන්තර විගණන ඒකකය ශක්තිමත් කිරීම කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමුකර නොතිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**
**-----------------------------**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම, තත්‍ය වියදම සමඟ සැසඳීමේදී අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා රු.112,830,000 ක් වැය කර තිබුණි. එසේම සංවර්ධන කාර්යයන්, ප්‍රාදේශීය සංවර්ධන කාර්යයන්, ස්ථාවර වත්කම් මිලදී ගැනීම හා අයභාර වියදම් සඳහා අයවැයගත ප්‍රතිපාදන හා තත්‍ය වියදම අතර සියයට 32 සිට සියයට 387 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.5 නොවිසඳී ඇති විගණන ඡේද**
**-------------------------------**

පසුගිය විගණන වාර්තාවලින් පෙන්වා දී ඇති නමුත්, ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු විගණන ඡේද පහත දැක්වේ.

**2014 වර්ෂය**
**-------------**

(අ) දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවට අයත් ගොඩනැගිල්ලක මණ්ඩලයේ එක් ගබඩාවක් පවත්වා ගෙන යනු ලබන පරිශ්‍රයේ කොටසක් උප බදු දී තිබුණු අතර ඒ සඳහා උප බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ බලතල හා කර්තව්‍යයන්ට පටහැනිව 2014 වර්ෂයේදී රු.4,020,848 ක වියදම් දරා තිබුණි.

(ඇ) 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 12(ට) වගන්තිය අනුව මණ්ඩලය විසින් 1988 වර්ෂයේ සිට පෞද්ගලික සමාගම්වල කර තිබුණු රු.929,548,150 ක් වූ ආයෝජන සඳහා මුදල් අමාත්‍යවරයාගෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ ආරක්ෂක සේවයේ රාජකාරී කළ බවට ව්‍යාජ අත්සන් යොදා ලබා ගත් රු.226,530 ක වැටුප් ආපසු අය කර ගෙන නොතිබුණි.

(ඉ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයට අයත් වාහන 5 ක් සහ නිලධාරීන් 4 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ සේවයට යොදවා 2014 වර්ෂයේදී වාහන නඩත්තු වියදම්, කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ලෙස රු.2,824,256 ක් මණ්ඩලය විසින් දරා තිබුණි.

**2013 වර්ෂය**

**--------------**

(ඊ) බදු කාලය දීර්ඝ කිරීමක් හෝ නව ගිවිසුමකට එළඹීමකින් තොරව 2013 අගෝස්තු 01 දින සිට 2013 දෙසැම්බර් 31 දක්වා බදු කුළී වශයෙන් රු.841,000 ක් ගෙවා තිබුණි.

(උ) ජාතික සවිය වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගෙවිය යුතු ලෙස දක්වා තිබූ රු.1,009,740 ක් එම කාර්යාලයෙන් තහවුරු කර ගැනීමකින් තොරව සහ විධිමත් අනුමැතියකින් තොරව ආදායමට බැර කර තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 3.5 වගන්තියට පටහැනිව යතුරු පැදි ණය හා ආපදා ණය දීමේදී මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාව මාසික වැටුපෙන් සියයට 50 ක් ලෙස සලකා ලබාදී තිබුණි.

(එ) ඉන්දියාවේ චෙන්නායි නුවර 2004 සිට 2009 කාලපරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබූ ශ්‍රී ලංකා වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳසැල් 5 කින් අය විය යුතු හිඟ කුළී හා විදුලි ගාස්තු රු.7,049,858 ක් 2016 අගෝස්තු 15 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

**2012 වර්ෂය**

**---------------**

(ඒ) "හම්බන්තොට බටඅත" කර්මාන්ත වැඩසටහනේ සම්භාණ්ඩ කර්මාන්ත ව්‍යාපෘතිය සඳහා රු.1,000,000 ක් ආයෝජනය කර ස්ථාපිත කළ පුද්ගලික සමාගමේ කටයුතු ආරම්භ කිරීම අත්හැර දමා තිබුණු බැවින්, ආයෝජනය කළ මුදල් මණ්ඩලයට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

**----------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ .

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ආයෝජන | නිසි අනුමැතිය ලබා නොගැනීම හා පසු විපරම් නොකිරීම. |

| | | |
|---|---|---|
| (ආ) | ණය පාලනය | අපනයන සමාගම් සමඟ ගිවිසුම් ඇති කර නොගැනීම හා ණය හා පොලිය අය කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | විශේෂ ව්‍යාපෘති පාලනය | මණ්ඩලයේ අරමුණුවලට පටහැනිව ව්‍යාපෘති ආරම්භ කිරීම හා ඉලක්කගත අරමුණු සපුරා ගැනීමකින් තොරව අතහැර දැමීම. කාර්යසාධන වාර්තා යාවත්කාලීන නොකිරීම. |
| (ඈ) | අයවැය පාලනය | අයවැයගත ආදායම් හා වියදම් හා තත්‍ය ආදායම් හා වියදම් අතර ප්‍රමාණාත්මක වෙනස්කම් පැවතීම නිසා අයවැය ලේඛනය පාලන කාරකයක් වශයෙන් යොදා නොගැනීම. |